(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 102.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

2011 ජූලි මස 06 වැනි බදාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0687/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ සමස්ත විදුලිබල උත්පාදනය සහ එම ප්‍රමාණයෙන් ජල විදුලිබල හා තාප විදුලිබල උත්පාදන ප්‍රතිශතයන් කවරේද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලය සහ පුද්ගලික අංශය විසින් උත්පාදනය කරනු ලබන තාප විදුලිබල ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ක්‍රමක්ෂය, පොළී ගෙවීම් සහ ණය ආපසු ගෙවීම් ඇතුළුව ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි නිෂ්පාදන පිරිවැය කවරේද;

(ii) උත්පාදනය කරනු ලබන තාප විදුලිබල ඒකකයක මිල සහ පුද්ගලික අංශය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට එම මිලට තාප විදුලිබලය සැපයීම සඳහා ගිවිසුම් ගත කාල සීමාව කවරේද;

(iii) තාප විදුලිබලය මිලදී ගැනීමට අදාළ ගිවිසුම්වල ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් කිසියම් වගන්තියක් තිබේද;

(iv) සූර්ය බලය හා සුළං බලය පදනම් කරගෙන විදුලිය උත්පාදනය කිරීමට සම්බන්ධ කිසියම් සංවර්ධන වැඩසටහනක් තිබේද;

(v) එවැන්නක් නොමැති නම්, එකී පුනර්ජනනීය ශක්ති ප්‍රභව විදුලිය උත්පාදනය සඳහා භාවිතා නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය අංශය විසින් උත්පාදනය කිරීමේදී;

(ii) පුද්ගලික අංශයෙන් මිලදී ගැනීමේදී;

(iii) ව්‍යාපාරික අංශයට සහ ගෘහස්ත පාරිභෝගිකයන්ට විකිණීමේදී;

විදුලි ඒකකයක සාමාන්‍ය මිල කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0833/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කටුනායක ගුවන් තොටුපලේ රාජකාරි කටයුතු සඳහා යොදවා ඇති ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ගුවන් තොටුපලේ රාජකාරියේ යෙදී සිටින එම සේවකයින් සපුරාලිය යුතු සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කටුනායක ගුවන් තොටුපලේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු සඳහා එම දෙපාර්තමේන්තුවට අයත් නොවන බාහිර පුද්ගලයින් යොදවා තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එම පුද්ගලයන්ගේ සුදුසුකම් කවරේද;

(iv) එවැනි පිරිසක් සේවයේ යෙදවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1050/'10

3\.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ස්වේච්ඡා ගුරුවරුන්, ගුරු සහායකවරුන් ලෙස පත්කිරීමට අදාළ 2006.10.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/2/20/4/1/47 උප දරන 2007.02.10 දිනැති ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කළ අයදුම්පත් කැඳවීම පරිදි මහනුවර දිස්ත්‍රික්කයේ කටුගස්තොට, ගම්පොල, තෙල්දෙනිය, වත්තේගම, දෙනුවර සහ මහනුවර යන අධ්‍යාපන කලාපවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් 61 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයේදී එම තනතුර සඳහා සුදුසුකම් ලද බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/2/29/4/1/47 List හා 2008.09.08 දිනැති ලිපිය මගින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් පිරිනමන ලෙසට මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම් වෙත නියෝග කර ඇති බවත්;

(ii) මෙතෙක් එම පත්වීම් ලබාදීම වෙනුවට 2010.02.10 දින ගුරු පුහුණුව සඳහා නියමිත මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කරමින් අධ්‍යාපන ලේකම් විසින් අංක ED/1/20/6/24 යටතේ ලිපි යැවීම පමණක් සිදුකර ඇති බවත්;

(iii) එම තත්ත්වය නිසා ගුරු සහායක පත්වීම් ලැබීමට නියමිත ඉහත පිරිස තවදුරටත් අසරණභාවයට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1166/'11

4\.

ගරු අනුර දිසානායක මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ පොහොර සහනාධාර වැඩ පිළිවෙළ යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පොහොර තොග බෙදුම්කරු ලෙස කෘෂිකාර්මික ගොවිජන වගාකරුවන්ගේ සංවිධානය ක්‍රියා කරන්නේද;

(ii) එම සංවිධානය පොහොර බෙදා හැරීම ආරම්භ කළ වර්ෂය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2006 සිට 2010 දක්වා වාර්ෂිකව ඉහත තොග බෙදුම්කරු වෙත සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් නිකුත් කළ එක් එක් පොහොර වර්ග තොග ප්‍රමාණය කවරේද;

(ii) වර්ෂ 2009 වන විට එම තොග බෙදුම්කරු විසින් ගොවිජන සේවා මධ්‍යස්ථානවලට බෙදාහරින ලද එක් එක් පොහොර වර්ග ප්‍රමාණයන් කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම බෙදුම්කරුට ලැබුණු පොහොර ප්‍රමාණය හා බෙදා හරින ලද ප්‍රමාණය අතර සංසන්දනයට අනුව තොග ඌනතාවයක් පවතින්නේ නම්, ඒ කොපමණද;

(ii) පොහොර මෙට්‍රික් ටොන් එකක වෙළඳපොළ වටිනාකම අනුව එම ඌන තොගවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත තත්ත්වය හේතුවෙන් රජයට හා ගොවි ජනතාවට පාඩුවක් සිදුවී ඇති බවත්;

(ii) අදාළ බෙදුම්කරු විසින් වංචාවක් සිදුකර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1212/'11

5.

ගරු වයි. ජී. පද්මසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටුවා ඇති රජයේ මධ්‍යම බෙහෙත් ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) අලුතින් මධ්‍යම බෙහෙත් ශාලා ඉදිකරගෙන යනු ලබන ස්ථාන කවරේද;

(iv) දැනට පවතින හා අලුතින් ඉදිකරගෙන යනු ලබන මධ්‍යම බෙහෙත් ශාලාවලට අමතරව රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින අවශ්‍යතාව සපුරාලීමට ස්ථාපනය කළ යුතු මධ්‍යම බෙහෙත් ශාලා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මධ්‍යම බෙහෙත් ශාලාවක් ස්ථාපනය කිරීමේදී අමාත්‍යාංශය මගින් සැලකිල්ලට ගනු ලබන නිර්ණායකයන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1215/'11

6.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනාධිපති අරමුදලට මුදල් ආධාර ලැබෙන ආකාරය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2008, 2009 සහ 2010 වර්ෂයන්හිදී, වෙන් වෙන් වශයෙන්,

(i) ජනාධිපති අරමුදලට වෙන් කරන ලද මුදල කොපමණද;

(ii) එම අරමුදලින් ලබාදුන් ආධාරවල එකතුව කොපමණද;

(iii) ජනාධිපති අරමුදලින් ආධාර ලබා දෙන ක්ෂේත්‍ර හා එක් එක් ක්ෂේත්‍රය වෙනුවෙන් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

(iv) ආධාර ලබා දුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1302/'11

7.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා බැංකුව සතු අංක 65 - 1990, 32 - 7394, 32 - 7393 සහ 65 - 1986 දරන වාහන හතර එක් වාහනයකට මාසිකව රු. 25000/- බැගින් වූ කුලී පදනම යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට ලබාදී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වාහනවලට අදාළ කුලී මුදල් 2009.10.09 දින සිට මේ දක්වා මුදල් අමාත්‍යාංශය විසින් ලංකා බැංකුවට ලබා දී තිබේද;

(ii) අනතුරට පත්වී ඇති අංක 65 - 1986 දරන වාහනය වෙනුවෙන් වන්දි මුදල් ලංකා බැංකුවට ගෙවා තිබේද;

(iii) එසේ නම්, ගෙවා ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අංක 65 - 1990 සහ 32 - 7393 දරන වාහන දෙක ආපසු ලංකා බැංකුවට භාරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0721/'10

8.

ගරු රවී කරුණානායක මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රබර් පර්යේෂණ ආයතනයේ ව්‍යාපෘති පිහිටා ඇති ස්ථාන කවරේද;

(ii) එවැනි එක් ඒකකයක් කළුතර දිස්ත්‍රික්කයේ පිහිටා තිබේද;

(iii) එසේ නම්, එම ස්ථානයේ නම කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විගණකාධිපතිගේ විමසීමට ලක්වූ 2000 වර්ෂයේ රබර් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ ව්‍යාපෘති පිරිවැය, අතිරේක වත්කම් නොමැතිව රු. මිලියන 700-800 ප්‍රමාණයක් වූයේද;

(ii) නොඑසේ නම්, ඉහත කී වර්ෂයේ පර්යේෂණ සඳහා වැය කළ මුදලේ නිවැරදි අගය කොපමණද;

(iii) එම කාරණය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට යොමු කරනු ලැබුවේද;

(iv) එසේ නම්, එම විමර්ශනයෙහි ප්‍රතිඵල කවරේද;

යන්නද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ගිවිසුමකට එළඹෙන අවස්ථාවේ වැය කිරීමට මුදල් නොතිබූ නමුත් මෙම ආයතනය සඳහා මුදල් වෙන් කළ ආයතන කවරේද යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0966/'10

9.

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සීමාසහිත ලංකා සළුසල ආයතනයේ වර්තමාන සභාපතිවරයා පත් කළ බලධාරියාගේ නම කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම සභාපතිවරයාගේ,

(i) සම්පූර්ණ නම හා වයස;

(ii) අධ්‍යාපන සුදුසුකම්;

(iii) පෙර සේවය කළ ස්ථානය, තනතුර හා වෘත්තීය පළපුරුද්ද;

(iv) වත්මන් මාසික වැටුප හා ලැබෙන වෙනත් දීමනා;

කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1213/'11

10.

ගරු වයි. ජී. පද්මසිරි මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වන විට ඇති පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙර පාසල්වල සේවය කරනු ලබන ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iii) සාමාන්‍යයෙන් එක් වර්ෂයකදී පෙර පාසැල් අධ්‍යාපනයට ඇතුළත් වන දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකාවේ පෙර පාසල් හා පෙර පාසල් ගුරුවරුන් ලියාපදිංචි කිරීම සඳහා සම්මත ක්‍රමවේදයක් අනුගමනය කරන්නේද;

(ii) පෙර පාසල් ගුරු පුහුණුව සඳහා අනුමත, ජාතික මට්ටමේ පුහුණු පාඨමාලාවක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1216/'11

11.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1303/'11

12.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික උරුමයක් වශයෙන් නම්කර ඇති යෝර්ක් වීදියේ ලංකා බැංකු ගොඩනැගිල්ල හෝටල් කළමනාකාර සමාගමක් වෙත බදුදීමට තීරණය කර තිබේද;

(ii) එම ගොඩනැගිල්ලේ පිහිටා ඇති ලංකා බැංකුවේ අගනුවර ශාඛාව සහ වෙනත් බැංකු අංශ එයින් ඉවත් කරන්නේද;

(iii) දැනට යෝර්ක් වීදිය ලංකා බැංකු ගොඩනැගිල්ලේ පිහිටා ඇති එම බැංකුවට අයත් ජී. ඕ. එච්. හෝටලය අලාභ තත්ත්වයෙන් පවත්වාගෙන යන්නේද;

(iv) එම තත්ත්වය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0722/’10

13.

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009.01.01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 16 වගන්තිය සහ 17 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම්වලට එළඹීමට ඉල්ලා සිටි රාජ්‍ය ව්‍යාපාර සංඛ්‍යාව සහ ගිවිසුම්වලට එළඹී ඇති සමාගම් සංඛ්‍යාව වාර්ෂික සහ ආංශික පදනමින් කවරේද;

(ii) ඉහත (අ)(i) හි සඳහන් ව්‍යාපාර අතරින් මේ වනවිට වාණිජ මෙහෙයුම් අරඹා ඇති ව්‍යාපාර සංඛ්‍යාව කවරේද;

(iii) ඉහත (අ)(i) හි පරිදි සිදුකර ඇති ආයෝජන ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සමාගම් විසින් භුක්ති විඳිනු ලබන බදු විරාමයන් කවරේද;

(ii) 2006.01.01 සිට 2008.12.31 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ලියාපදිංචි වූ සහ මෙහෙයුම් ඇරඹූ සමාගම් සංඛ්‍යාව වාර්ෂික පදනමින් සහ ආයෝජන මණ්ඩලයේ එක් එක් අංශ පදනමින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0984/’10

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(ආ) (i) විල්පත්තු අභය භූමිය තුළ වැලි ගොඩ දැමීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇති අවසර පත්‍රය ඉදිරිපත් කරන්නේද;

(iii) එම බලපත්‍රය ලබා දුන් බලධාරියා කවරුන්ද;

(iv) එම බලපත්‍රය මගින් වැලි ඉවත් කිරීමට අවසර ලැබී ඇති පුද්ගලයා හෝ පුද්ගලයින් කවරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම අභය භූමියෙන් මේ වන විට ඉවත් කර ඇති වැලි ප්‍රමාණය කොපමණද;

(ii) එම වැලි කවර කටයුත්තක් සඳහා රැගෙන යනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1304/'11

15.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 ජනවාරි මස 02 වැනි දින සිට 2010 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ ලංකා බැංකුවට බඳවා ගෙන ඇති උපදේශකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ උපදේශකයින් බඳවා ගැනීමට මුදල් අමාත්‍යාංශයේ අනුමතිය ලබාගෙන තිබේද;

(iii) උපදේශක තනතුර සඳහා අදාළ බඳවා ගැනීමේ සුදුසුකම් කවරේද;

(iv) උපදේශක තනතුර සඳහා බඳවා ගත් අයෙකුට ගෙවන මාසික වැටුප්, දීමනා හා වෙනත් පහසුකම් කවරේද;

(v) ඉහත පරිදි බඳවාගෙන ඇති උපදේශකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.00 දක්වා විය යුතු ය. අ. භා. 7.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ජයවික්‍රම පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 103— වැඩසටහන 1,—† 2011 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2011 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන්වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබා ගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් බිලියන විස්සකට (රු. 20,000,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතුවන අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතු ය.

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 103 - | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | | |
| වැඩ සටහන | 1 - | මෙහෙයුම් වැඩසටහන | | |
| ව්‍යාපෘතිය | 2 - | අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා | | |
| | | ප්‍රාග්ධන වියදම | රු. | 20,000,000,000 |
| | | **මුළු වියදම** | **රු.** | 20,000,000,000 |

(රුපියල් බිලියන විස්සක් පමණි.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2011 ජූනි මස 23 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 අංක 1 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*2.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*3.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*4.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*10.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*11.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*12.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*13.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*14.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

අධිකරණ අමාත්‍යතුමා,— ණය සහනදායක ආඥාපනත යටතේ නියෝග,— (81 වැනි අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 63 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී ආඥාපනතේ 6 සහ 10 වැනි වගන්ති යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබ, 2011.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

17.

අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0175/'10

1\.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) තංගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා, කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නිත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම, ලිපිනය සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0668/'10

2\.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේදී,

(i) ආනයනය කළ සහල්, පිටි, සීනි, පළතුරු, කුළු බඩු ඇතුළු සියලු ආහාර ද්‍රව්‍යයන්ගේ ප්‍රමාණයන්;

(ii) එම ද්‍රව්‍ය ආනයනය කළ රටවල්;

(iii) මෙරටට ගෙන්වන ලද ආයතන හා පුද්ගලයින්;

(iv) රටට ගොඩබාන විට එක් එක් ආහාර වර්ගයේ වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0176/'10

3.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ඉඩමේ ස්වභාවය හා වාර්ෂික ආදායම කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(iv) ඒ කවර කාර්යයක් සඳහා කවර පදනමකින්ද;

(v) එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය, කාල සීමාව හා කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම් ඔවුන්ගේ නම්, ඉඩම් ප්‍රමාණය සහ ඒ කවදා සිටද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා 2009.08.01 දිනට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම, ලිපිනය සහ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0858/'10

4.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) බස්නාහිර, සබරගමුව, වයඹ, මධ්‍යම, ඌව, උතුරු මැද, නැගෙනහිර සහ උතුරු පළාත් සභාවන් තුළ මධ්‍යම රජයට හා පළාත් සභාවට අයත් පාසල්හි සේවය කරන ගුරුවරුන්ට හිඟ වැටුප් ගෙවීමට තිබේද යන්න එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ හිඟ වැටුප් ගෙවීමට තිබේ නම්, 2010.01.01 දින වනවිට ඒ ඒ පළාත් මට්ටමින් ගුරුවරුන්ට ගෙවිය යුතු හිඟ වැටුප් ප්‍රමාණයන්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම හිඟ වැටුප් ගෙවීමට රජය මඟින් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ වෙන්කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හිඟ වැටුප් නොගෙවීමෙන් එම ගුරුවරුන්ට අසාධාරණයක් වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ගුරුවරුන්ට හිඟ වැටුප් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0974/'10

5.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2005 - 2010 දක්වා කාල සීමාව තුළ විදේශ රටවල සේවයේ නියුක්ත වී ඇති ශ්‍රී ලාංකිකයින්ගේ සංඛ්‍යාව එක් එක් රට හා රැකියා ක්ෂේත්‍රය අනුව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2005 - 2010 දක්වා කාලසීමාවේදී විදේශ සේවා නියුක්තිය මගින් ශ්‍රී ලංකාව උපයන ලද ආදායම කොපමණද;

(ii) එම ආදායම, සමස්ත රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0975/'10

6.

ගරු අජිත් කුමාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන විදේශ රැකියා නියෝජිත ආයතනයක් ලියාපදිංචි කළ යුතු රාජ්‍ය ආයතනය කුමක්ද;

(ii) එසේ ලියාපදිංචිවීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි කවරේද;

(iii) මේ වන විට ලියාපදිංචි වී ඇති විදේශ රැකියා නියෝජිතායතන සංඛ්‍යාව, ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලියාපදිංචි නොවූ විදේශ රැකියා නියෝජිත ආයතන හඳුනාගෙන තිබේ නම්, එම ආයතන සංඛ්‍යාව, ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) එවැනි නියෝජිතායතන සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති හා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාවේදී ලියාපදිංචි වී ඇතත් පසු කාලයේදී මූලික කොන්දේසි කඩකිරීම නිසා ලියාපදිංචිය අවලංගු කර හෝ නීතිමය පියවර ගන්නා ලද විදේශ රැකියා නියෝජිතායතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙරට ක්‍රියාත්මක වන විදේශ රැකියා උප නියෝජිතායතන තිබේද;

(ii) එවැනි ආයතන විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හෝ රජයේ වෙනත් ආයතනයක ලියාපදිංචි කළ යුතුද;

(iii) එසේ නම්, ඊට අදාළ කොන්දේසි කවරේද;

(iv) එසේ ලියාපදිංචි කර ඇති උප නියෝජිතායතන සංඛ්‍යාව, ඒවායේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?